# 07

# මිතුරකුට ඇරයුමක්





**විජය සමන්ගේ මිතුරෙකි. කොළඹ පදිංචි විජය අනුරාධපුරයේ සිටින සමන්ට ලිපියක් ලියයි. එය ලියන්නේ ඉතා වැදගත් ප්‍රදර්ශනයක් නැරඹීමේ අවස්ථාව මිතුරාට ලබා දීම සඳහා ය.**

විජය සිරිවර්ධන,
අංක 04,
සමන්පුර,
බත්තරමුල්ල.
20090212.

සෙත් වේවා!

හිතාදර සමන්,

මේ ලියන්නේ ඔබට අලුත් ම තොරතුරු කීපයක් දන්වන්නටයි. මේ දිනවල 'පිබිදෙන සිරිලක' නමින් මහා ප්‍රදර්ශනයක් කොළඹ, බණ්ඩාරනායක අනුස්මරණ සම්මන්ත්‍රණ ශාලාවේ පැවැත්වෙනවා. පෙබරවාරි මස 10 වන දා සිට 20 වන දා තෙක් මෙම ප්‍රදර්ශනය පැවැත්වෙනවා. මම අපේ අම්මා හා තාත්තා සමග ප්‍රදර්ශනය නැරඹීමට මුල් දිනයේ ම ගියා.

ප්‍රදර්ශනයට සහභාගි වන සියලු දෙනාට ම ප්‍රදර්ශනයේ විස්තර ඇතුළත් පොඩි පොතක් දෙනවා. ප්‍රදර්ශන කුටි 38ක් තියෙනවා. ප්‍රදර්ශන භූමියට ඇතුළු වන විට ම අමුතු ලෝකයකට ගියා වගේ මට දැනුණා. ඒ තරම් ම ලස්සනයි. හරි ම පුදුමයි. "ගුවන් මැදුරේ" කුඩා ගුවන් යානාවක් අහසේ යන හැටි පෙන්වනවා. "සාගර මැදුරෙත්" හරි ලස්සන දේවල්



නොමිලේ බෙදා හැරීම සඳහා ය.

තියෙනවා. යුද්ධ කාලේ දී ඈත මුහුදේ යාත්‍රා කරන සතුරු නැවකට පහර දෙන, මුහුද යටින් වේගයෙන් ගමන් කරන "සබ්මැරින් යාත්‍රාවක්" එහි ප්‍රදර්ශනයට තබා තිබෙනවා. ඒක ඇතුළට ගිහින් බලන්න පුළුවන්. හරි ම අපූරුයි.

"මැණික් මාලිගාව" නැරඹිය යුතු තැනක්. ලංකාවේ ඒ ඒ පළාත්වලින් ලැබෙන මැණික් වර්ග රාශියක් පෙන්වනවා. "සුව සෙත" මැදිරියේ තියෙන්නේ පුදුම දේවල්. පෙනහලුවලට ලැබෙන ඔක්සිජන් නිසා අපේ ශරීරය පුරා ම රතු ලේ ගමන් කරන හැටි වීදුරුවලින් සෑදූ මිනිස් රුවකින් පෙන්වනවා. මට නම් හරි ම පුදුමයි.

තවත් ලස්සන තැනක් තමයි "දුම්රිය මැදුර". කොළඹ කොටුවේ සිට බදුල්ල දක්වා ඇති දුම්රිය මාර්ගයේ අනුරුවක් හදලා තියෙනවා. කුඩා දුම්රියක් කොටුවේ දුම්රියපොළෙන් පිටත් වෙලා බදුල්ල දක්වා යනවා. එහි දී හමුවන ප්‍රධාන දුම්රියපොළවල් හා බිංගෙවල් ද කඳු හෙල් මිටියාවත් ද පසු කර යන ගමන හරි ම අපූරුයි.



ජනකලා කේන්ද්‍රයේ දහඅට සන්නියට අදාළ වෙස් මුහුණු පෙන්වනවා. රූකඩ නැටුම්වලට යොදාගන්නා රූකඩත් පෙන්වනවා. ලස්සන ම දේ තමයි සළුපාලිය. එය රඟ දක්වන ආකාරය හරි ම විනෝද ජනකයි.

තවත් ගොඩක් දේවල් තියෙනවා. කියලා නිම කරන්න බෑ. ඇවිල්ලා ම බලන්න ඕන. අම්මා තාත්තත් එක්ක සමන් ලබන සෙනසුරාදා උදෙන් ම එන්න. අනුරාධපුරෙන් රෑ කෝච්චියේ ආවා ම උදේට කොළඹට එන්න පුළුවන්. සෙනසුරාදා ප්‍රදර්ශනය බලලා එදා රෑ අපේ ගෙදර ඉඳලා, ගමට යන්න

පුළුවන්. එහෙනම් සමන් කොහොම හරි එන්න බලන්න. ඔබ සියලු දෙනාට ම දෙවි පිහිටයි!

මීට,
හිතාදර මිත්‍ර,
විජය.



## ක්‍රියාකාරකම 01

මේ ලිපියේ දක්වෙන ප්‍රදර්ශන භාණ්ඩ ලැයිස්තු ගත කරන්න.
இக்கடிதத்தில் உள்ள கண்காட்சிப் பொருட்களைப் பட்டியல் படுத்துக.

## ක්‍රියාකාරකම 02

මෙම ලිපිය කියවා බැලූ සමන් තුළ ප්‍රදර්ශනය නැරඹීමට මහත් ආශාවක් ඇති වෙයි. ඔබ සමන් යයි සිතා තමා කොළඹ එන බව දන්වමින් විජයට පිළිතුරු ලිපියක් ලියන්න.
இக்கடிதத்தை வாசித்து அறிந்ததும் சமனுக்கு கண்காட்சியைப் பார்க்க வேண்டும் என்ற பெரும் ஆசை ஏற்படும். நீங்கள் சமன் என நினைத்து தான் கொழும்புக்கு வருவதாகத் தெரிவித்து விஜயாவுக்கு பதில் கடிதம் ஒன்றை எழுதுக.

## ක්‍රියාකාරකම 03

ඔබ ගමේ ළමා සමාජයේ සාමාජිකයෙකි. මෙවර පොසොන් පෝයට පසු දින ළමා සමාජය ගමේ වයසක ආච්චිලා සීයලා පන්සලට කැඳවනවා. එහි දී ඔවුන් නාවනවා. අලුත් ඇඳුම් අන්දවනවා. ඉන් පසු ආහාරපාන දෙනවා. අවසානයේ තෑගිත් දෙනවා. මෙයට උපකාර කිරීම සඳහා සහභාගී වන ලෙස දන්වමින් මිතුරකුට ලියුමක් ලියන්න.

## ක්‍රියාකාරකම 04

තම පාසලේ පැවැත්වෙන නිවාසාන්තර ක්‍රීඩා උත්සවය නැරඹීමට පැමිණෙන ලෙස දන්වමින් තම මිතුරකුට ලිපියක් ලියන්න.
உமது பாடசாலை இல்ல விளையாட்டுப் போட்டியை கண்டுகளிக்க சமுகமளிக்குமாறு அறிவித்து உமது நண்பன் ஒருவனுக்கு ஓர் கடிதம் வரைக.